# දළඹූ පැංචා

# සමනලයෙක් වුණු හැටි



උදේශි පවනි යාපා බණ්ඩාර

# දළඹු පැංචා සමනලයෙක් වුණු හැටි


## උදේශි පවනි යාපා බණ්ඩාර

චිත්‍ර : උදේශි පවනි යාපා බණ්ඩාර



**ISBN-978-624-206-743-8**

**ප්‍රථම මුද්‍රණය. : 2023.11.15**


කර්තෘගේ වෙනත් කෘති : මගේ පුංචි බලු රාළ

: කුරුලු පවුල

# පිදුම

මා හට ශක්තියක් වූ

අම්මාටත් තාත්තාටත්

මෙම පොත ලිවීමට  මාව උනන්දු කරපු ආදරණීය

සමන්මලී ගුරුතුමියටත්

මෙම පොත් පිංච උපහාරයක්  ම

වේවා.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු. සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුලින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩ ගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමයකරගත් මහාමායා දියණියන් වසර ගනනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්රහනයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමී.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරු භවතුන්, දෙමාපියන් ආදී ශිෂ්‍යයාවන් සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය- මහනුවර

2023.11.01

මම දවසක් වත්තට යනකොට කොළයක සමනලයෙක් වහලා ඉන්නවා දැක්කා.මට මෙහෙම හිතුණා.




මම ටික දවසකින් ආයෙම එතනට ගියා.මෙන්න සමනලයා වහපු කොළයේ සුදුපාට රවුමට රවුමට මොනවදෝ තියෙනවා.




මම ගේ ඇතුළට ගිහිල්ලා  අම්මාට කතා කළා .




මේ බලන්න මේ කොළය දිහා. මේ මොනවද අම්මේ ?
ඔය සමනලයන්ගේ බිත්තර
සමනලයාගේ බිත්තර වලට පස්සෙ එන්නෙත් සමනලයෙක් ද?
නෑ ඉන්නකො. මම ඔයාට සමනලයාගේ ජීවන චක්‍රය පෙන්නන්නම්.


“මේ තියෙන්නෙ ජීවන චක්‍රය. හොඳට බලන්න.”



ටික කාලයක් ගත වුණා. මම එළියට ගිහිල්ලා ආයෙත් කොළය දිහා බැලුවා.මම අම්මාට කතා කළා.

“අම්මේ මේ දළඹුවෝ නේද?”

“ඔව්. ඔව්…තවත් දෙයක් තියෙනවා, එයාලාට ළංවෙන්න එපා. ගෑවුනොත්  කසනවා.”




මම තව ටික දවසකින් ආපසු වත්තට ගියා.

මට ඕන වුණා දළඹු පැංචා මොකද කරන්නේ කියලා බලන්න..

"අනේ මෙයාලා කෝෂයක් හදාගෙන නේ."

"ඔන්න දුවේ... තව ටික දවසකින් මෙන්න මේ කෝෂයෙන් ලස්සන සමනල පැංචෙක් එළියට එයි."



ටික දවසකින් මම ආයෙමත් වත්තට ගියා.

දළඹු පැංචා බලන්න.

මෙන්න කෝෂය පලාගෙන ලස්සන සමනලයෙක්
එළියට ඇවිල්ලා.

අම්මා කිව්වේ ඇත්ත තමා.



සමනල  පැටියා ඇවිත් මගේ අතේ  වැහුවා. මම

සමනලයාට කීවා.

“ආයෙත් දවසක හමුවෙමු. ඔයාගෙ යාළුවොත්
ඇවිල්ලයි ඉන්නේ..”



මමයි අම්මයි සමනල  පැංචා ඈතට ඈතට ඉගිල්ලිලා යනකන් හුඟාක් වෙලා බලාගෙන හිටියා.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ  සිදුවන සමාජ ආර්ථික  පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස් වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත් කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්ම දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන්, ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශණය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟ පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම් කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත් කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්තකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක.

2023.11.01